## 14.

# විනය පැනවීමෙහිලා බුදුරදුන්ගේ භූමිකාව

සහය කථිකාචාර්ය, පූජ්‍ය පහලගම ධම්මික හිමි

බුද්ධචරිතය අධ්‍යයනයෙහිලා සූත්‍ර පිටකයේ බොහෝ සූත්‍ර ඇත. ඒ අතුරින් දීඝ නිකායේ ලක්ඛණ හා මජ්ඣිම නිකායේ බ්‍රහ්මායු වැනි සූත්‍ර වැදගත් වෙයි. ඒ සූත්‍ර තුළ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ සහිත බුද්ධ කාය විස්තර වෙයි. අරියපරියේසන වැනි සූත්‍ර තුළ කාය සම්පත්තියට වඩා ඤාණ සම්පත්තිය ප්‍රකට ලෙස දැක්වේ. බොහෝ සූත්‍රවල අන්තර්ගත වන්නේ බුද්ධ ඤාණයයි. එම නිසා බුදුරජාණන් වහන්සේ පිළිබඳව සූත්‍ර පිටකයේ දී හමු වන්නේ කායික සම්පත්තිය හා ඤාණ සම්භාරයත් චර්යාත්මක කරුණුත් පදනම්වය. සූත්‍ර පිටකයේ හමු වන බුද්ධ චරිතය තුළින් උත්තරමානුෂීය ගුණාංග ප්‍රකට වෙයි. එසේ වුවත් ඉන් දේවත්වයක් බ්‍රහ්මත්වයක් ආරෝපණය නොවෙයි. මනුස්ස ලෝකය තුළ උපන් උපක්ලේශ නැති කළ ආර්ය උතුමකු ලෙස බුද්ධ චරිතය විස්තර වෙයි. ආශ්චර්යමත් ධර්මයක් දේශනා කළ බුදුරජාණන් වහන්සේ දෙවියෙක් ද බ්‍රහ්මයෙක් ද මනුස්සයෙක් ද යන ප්‍රශ්නාර්ථයට පිළිතුරු විවිධ සූත්‍ර වල අන්තර්ගත වෙයි. ඒ බව පැහැදිලි වන ඉතා වැදගත් අවස්ථාවක් වන්නේ බුදුරජාණන් වහන්සේ හා ද්‍රෝණ බමුණා අතර ඇති වන සංවාදයයි. බුදුරජාණන් වහන්සේ උක්කට්ඨා නුවර හා සේතව්‍යා නුවර අතර වඩිද්දී ද්‍රෝණ බමුණා මුණ ගැසුනේය. එහි දී බුදුරජාණන් වහන්සේ හා ද්‍රෝණ බමුණා අතර ඇති වූ සංවාදයෙන් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මනුෂ්‍යත්වය යි.

එහි දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ''මම මනුෂ්‍යයෙක් නොවෙමි. මම දෙවියෙක් හෝ ගාන්ධර්වයෙක් හෝ යක්ෂයෙක් හෝ මනුෂ්‍යයෙක් හෝ වී නම් කාමාදි ආශ්‍රවයන් මා තුළ තිබිය යුතුය. එහෙත් මම ඒ සියල්ල ප්‍රහීණ කළා''[1] බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මනුෂ්‍යත්වය උපමාවක් මගින් පැහැදිලි කොට ඇත්තේ මෙසේය.

සික්ඛා : ශාසනික ශික්ෂණ සැලැස්ම
සංස්: රළුවේ පද්මසිරි හිමි, ජී.ඒ. ගාමිණී රත්නශ්‍රී, ආලෝකා ලියනගේ - 2021 මාර්තු

පුණ්ඩරීකං යථාවග්ගු - තොයෙන නුපලිප්පති

නුපලිත්තෝම්හි ලොකෙන - තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ[2]

බ්‍රාහ්මණය, උපුල් හෝ නෙළුම් හෝ මලක් දියෙන් ඉපිද දියෙහි වැඩී දියෙන් ඉස්මතු වී දියෙහි නො ගැටී පවතින්නාක් මෙන් මමත් ලෝකයෙහි මිනිසුන් අතර වැඩී ලෝකයාගෙන් ඉස්මතු වී ලෝකයා සමඟ නො ගැටී නොබැඳී සිටිමි. ඒ නිසා මම බුදුවරයෙක් වෙමි. මෙම සංවාදයෙන් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ දෙවියකු, බ්‍රහ්මයකු, යක්ෂයකු, ගාන්ධර්වයකු හෝ බ්‍රහ්මයකු නොවන බවයි. බුදුරදුන් මනුෂ්‍ය මාපිය සම්භවයක් ඇති උතුමකු බවත්‍ය. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය පිළිබඳ පාලි සූත්‍රයන්හි දැක්වෙන තොරතුරුවලින් බුදුරදුන්ගේ උත්තරීතර මනුෂ්‍යත්ය වඩාත් ප්‍රකට වෙයි.

සිද්ධාර්ථ කුමරුගේ උපත පිළිබඳ අසිරිමත් ආකාරයේ පුවත් ථෙරවාදී සම්ප්‍රදායයහි ජනප්‍රියත්වයට පත් වී ඇත. බෝසතුන් ලොව ඉපදීමට පෙර පඤ්චමහා විලෝකනය සිදු කළ බව සඳහන් වෙයි.[3] එහි දී උත්පත්තිය සඳහා සුදුසු මවක් සිටීදැයි සොයා බැලීය . ඒ මවට ආයුෂ තිබිය යුත්තේ දරු කුස පිළිසිඳ ගත් පසු මාස 10 යි දවස් 7 පමණි. එය ධර්මතාවකි. එම මව ස්භාවයෙන් ම සිල්වත් මවකි. මවත් ඒ වන විට මිනිස් ලොව ඉප දී ඇති බැවින් ඇසළ පොහොය දිනයේ මෙලෙසින් මව් කුස පිළිසිඳ ගත්තාය. මහා මායා දේවිය ඇසළ පොහොය දවසේ යහනාවේ නිදා සිටින විට විස්මිත සිහිනයක් දුටුවාය. චාතුම්මහා රාජික දෙව්ලොව සිටින සතර වරම් දෙවිවරු දේව ආභරණවලින් සැරසී බිසවුන් නිදා සිටි යහන හතර පැත්තෙන් අල්ලාගෙන ආකාශයෙන් රැගෙන ගොස් හිමාලයේ රිදී පර්වතයක පසේ බුදුවරුන් වහන්සේලා විවේකීව වැඩ සිටින මංජුසක නැමති රුක්ෂය පාමුල යහන තබන ලදි. පසුව සතර වරම් දෙවිවරුන්ගේ බිසවුන් වහන්සේලා පැමිණ අනෝතප්ත විලට ගෙන ගොස් නහවා දිව්‍ය සලුවලින් සරසා නැවත යහනාවේ හිඳවීය. නැවත සතර වරම් දෙවිවරු පැමිණ යහනාව ස්වර්ණ වර්ණ ගල් තලාවකට රැගෙන ගොස් තැබුවේය. මහාමයා දේවිය දකුණු ඇලයෙන් හාන්සි වී සිටින විට ඇතින් සුදු ඇත් පැටියෙක් සුදු නෙලුමක් සොඬින් ගෙන තුන් වරක් මහාමායා දේවිය වටා

පැදකුණු කර දකුණු ඇලයෙන් කුසට ඇතුල් විය. සම්බුද්ධත්වයට පත්වන්නා වූ මහාපුරුෂයකුගේ උපතක් සිදු වෙන බව මෙම කථා පුවත තුළින් ප්‍රකාශ වෙයි. මෙයින් බුදු උපතේ දුර්ලභ බව හා ආශ්චර්ය පැහැදිලි වෙයි.

සිද්ධාර්ථ චරිතය අධ්‍යයනය කිරීමේ දී පාලි මූලාශ්‍ර භාවිත කිරීම විශ්වසනීය කරුණු දැන ගැනීමට හේතු කාරක වෙයි. සිද්ධාර්ථ බෝසතුන් හා අනෙකුත් බෝසත් උප්පත්තියක දී සිදු වන පොදු ධර්මතා දීඝනිකායේ මහාපදාන සූත්‍රයේ විස්තර කොට ඇති අයුරු මෙහි දී වැදගත් වෙයි. බෝධි සත්ත්වයන්ගේ උපතේ සිදු වන ධර්මතා කීපයක් සූත්‍රයේ දක්වා තිබේ. ඒවා නම්,

01. සිහි නුවණින් යුක්තව මව් කුස පිළිසිඳ ගැනීම[4]

02. ලෝකාන්තරික නරකයෙහි පවා අඳුර දුරු වී මුළු ලෝකය පුරම මහා ආලෝකයක් පැතිර යාම.[5]

03. සතරවරම් දෙවිවරු බෝධිසත්ත්ව මවට සතර දිශාවෙහි ආරක්ෂා කරති.[6]

03. බෝධිසත්ත්වයන් වහන්සේ පිළිසිඳ ගත් දින සිට බෝධිසත්ත්ව මාතාව තුළ සරාගික අදහස් පහළ නොවෙයි බෝධිසත්ත්ව මාතාව මනාව සිල් රකියි.[7]

04. බොධිසත්ත්වයන් වහන්සේ මව් කුසට පැමිණි කල බොධිසත්වයන් වහන්සේගේ මවට කිසියම් පුරුෂයකු කෙරෙහි කාමාශාවක් නූපදී[8]

05. බෝධිසත්ත්වයන් වහන්සේ මව් කුසට පැමිණියේ වේද එකල බෝධිසත්ත්ව මාතාව බොහෝ සම්පත් ලබන්නී වෙයි.[9]

04. බෝසත්ත්ව කුමරා මාතාවට ලෙඩ දුක් නො වැළදෙන සේ මාතෘ ගර්භය තුළ හොඳින් වැඩෙයි.[10]

05. බෝධිසත්ත්වයන්ගේ උපතින් සත්වෙනි දිනයෙහි බෝධිසත්ත්ව මාතාව කළුරිය කොට තුසිත දිව්‍ය ලෝකයෙහි උපදී.[11]

06. බෝධිසත්ත්වයන් දසමසක් ම මව්කුස තුළ සිටියි.[12]

06. බෝධිසත්ත්ව මාතාව හිටිවන ම බෝධිසත්ත්වයන් වහන්සේ ප්‍රසූත කරයි.[13]

07. බෝධිසත්ත්වයෝ මව්කුසින් බිහිවෙත් ම පළමු කොට දෙවියෝ ද පසුව මනුෂ්‍යයෝ ද පිළිගනිති.[14]

08. බෝධිසත්ත්වයෝ මව් කුසින් නික්මෙත් ද දෙව්වරු හතරදෙනෙක් පිළිගෙන මැණියන් ඉදිරියේ තබයි.[]

08. උපතේ දී බෝධිසත්ත්වයන් වහන්සේගේ ශරීරය මළ මූත්‍රා කිසිවකින් අපිරිසිදු නොවෙයි.[15]

09. උපන් විගස බෝධිසත්ත්වයන් වහන්සේගේ මාතාවගේ අවශ්‍යතා අනුව උණු හා සීතල දිය දහර දෙකක් අහසින් වැටෙයි.[16]

10. බෝධිසත්ත්වයන් වහන්සේ උපන් විගස ම පියවර හතක් ඉදිරියට ගොස් අභීත සිංහ නාද කරයි.[17]

11. බෝධිසත්ත්වයන් වහන්සේ උපත හේතු කොට ගෙන දස දහසක් ලෝක ධාතුව කම්පාවට පත්වෙයි.[18]

බෝධි සත්ත්වයෝ මව් කුස පිළිසිඳ ගැනීමේ දී සිදුවන ධර්මතා ලෙස මහාපදානසූත්‍රය දක්වා තිබේ. මජ්ඣිම නිකායේ උපරිපණ්ණාසකයේ සුඤ්ඤතා වග්ගයේ දැක්වෙන අච්ඡරිය අබ්භූතධම්ම සූත්‍රයේ ද සිද්ධාර්ථ කුමාර උත්පත්තිය පිළිබඳ තොරතුරු හමුවෙයි. එහි දී දැක්වෙන්නේ මහාපදාන සූත්‍රයේ දැක්වෙන කරුණු හා සමාන කරුණු ආශ්චර්ය අද්භූතධර්ම වශයෙනි. වෙනත් සත්ත්වයකුගේ මවුකුස පිළිසිඳ ගැනීමට වඩා ගුණයෙන් ආඪ්‍ය බවක් මෙයින් මතු වෙයි. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය ආශ්චර්ය සම්පන්නය. එසේ මනුෂ්‍ය දරුවකුගේ උපතේ ස්වභාවය ප්‍රකට වෙයි. මහාසත්ත්වයකු බැවින් බෝධිසත්ත්ව උපත මහානුභාවය සම්පන්න වෙයි.

ගිහිගෙයින් නික්මී සත්‍ය ගවේශීව ගෙවූ දිවියේ දී සිද්ධාර්ථ චරිතයේ විශිෂ්ට ලක්ෂණ අනාවරණය වෙයි. ගුරුවරුන් පරයා අවබෝධ කර ගැනීමේ හැකියාව තිබූ බව මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රයෙන් පෙන්නුම් කරයි. උද්දකරාම පුත්තයන් සමීයට ගිය විට

''එහි දානි, ආවුසො, තුවං ඉමං ගණං පරිහරාති. ඉති බො, භික්ඛවෙ, උදකො රාමපුත්තො සබ්‍රහ්මචාරී මෙ සමානො ආචරියට්ඨානෙ මං ඨපෙසි, උළාරාය ච මං පූජාය පූජෙසි''[19] සිද්ධාර්ථ කුමාර අවධිය පිළිබඳ මුල් බුදුසමයාගත සූත්‍ර ධර්ම තුළින් තොරතුරු අනාවරණය කර හැකි අවස්ථා බොහෝ දක්නට ලැබේ.

සූත්‍ර පිටකයේ දී බුදුරජාණන් වහන්සේ ධර්මය ශ්‍රාවකයා කරා යොමු කොට විමුක්තියට මාර්ගය පෙන්වා දෙයි. ඒ බව වඩාත් හොඳින් පැහැදිලි වන ස්ථානයක් නම් සුත්තනිපාතයේ රාහුල සූත්‍රය යි.

> නාහං අභිණ්හසංවාසා, අවජානාමි පණ්ඩිතං, උක්කාධාරො මනුස්සානං, නිච්චං අපචිතො මයා[20]

අන්‍යයන්ට මාර්ගය කියාදෙන්නා තමන්වහන්සේගේ ඇගයීමට ලක්වන බව දැක්වේ. නිරන්තරයෙන් බුදුරදුන් ශ්‍රාවකයාගේ සැපය පිළිබඳ ක්‍රියා කොට ඇත. ඒ සඳහා බහු ජන හිතාය බහු ජන සුඛාය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට විය.

සූත්‍ර ධර්ම තුළින් හමුවන බුද්ධ චරිතයේ විශේෂත්වය වන්නේ යම් සූත්‍රයක් දේශනා කරමින් සිටිය දී කිසියම් ආකාරයක කායික ආබාධයක් ඇති වූයේ නම් සූත්‍රයේ ඉතිරි කොටස ශ්‍රාවකයකුට දේශනා කිරීමට භාරදෙයි. මජ්ඣිම නිකායේ එන සේඛ සූත්‍රය එබඳු දේශනාවකි. ''පටිභාතු තං, ආනන්ද, කාපිලවත්ථවානං සක්‍යානං සෙඛො පාටිපදො. පිට්ඨි මෙ ආගිලායති, තමහං ආයමිස්සාමීති. එවං භන්තෙති බො ආයස්මා ආනන්දො භගවතො පච්චස්සොසි. අථ බො භගවා චතුග්ගුණං සඞ්ඝාටිං පඤ්ඤාපෙත්වා දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙසි, පාදෙ පාදං අච්චාධාය, සතො සම්පජානො, උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා''[21] බුදුරදුන්ගේ පිටේ ඇති වූ ගිලන් බව නිසා ආනන්ද හිමියන්ට සූත්‍රය ඉදිරියට දේශනා කිරීමට පවරා බුදුරදුන් සැතපුනේය. ආනන්ද හිමියන්ගේ දේශනාව අවසානයේ බුදුරදුන් ප්‍රකාශ කර සිටියේ ''අථ බො භගවා උට්ඨහිත්වා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි. සාධු සාධු, ආනන්ද, සාධු බො ත්වං, ආනන්ද, කාපිලවත්ථවානං සක්‍යානං සෙඛං පාටිපදං අභාසීති.''[22] වශයෙන් ඇගයුමට ලක්කරන ලදී. එසේ ම ධම්මදින්නා භික්ෂුණිය විසින් දේශනා කළ චුල්ලවේදල්ල

සූත්‍ර පිළිබඳ ප්‍රකාශ කළේ ඇගයුම්ශීලී බවකි. ධම්මදින්නා භික්ෂුණියගෙන් ධර්මය ඇසූ විසාඛ උවසු බුදුරදුන් හමුවීට යයි. මෙ පුවත ඇසූ බුදුරදුන් විසාඛ උවසු හට ප්‍රකාශ කරන්නේ ''එවං වුත්තෙ, භගවා විසාඛං උපාසකං එතදවොච පණ්ඩිතා, විසාඛ, ධම්මදින්නා භික්ඛුනී, මහාපඤ්ඤා, විසාඛ, ධම්මදින්නා භික්ඛුනී. මං චෙපි ත්වං, විසාඛ, එතමත්ථං පුච්ඡෙය්‍යාසි, අහම්පි තං එවමෙවං බ්‍යාකරෙය්‍යං, යථා තං ධම්මදින්නාය භික්ඛුනියා බ්‍යාකතං. එසො චෙවෙතස්ස ධාරෙහීති.''[23] මම දේශනා කළත් ඒ පිළිබඳ එසේ ම ප්‍රකාශ කරන බව දේශනා කරයි. මෙයින් පැහැදිලි වන්නේ බුද්ධ චරිතය සූත්‍ර පිටකයේ දී ඇගයුම්ශීලී මෙන් ම සහයෝගී බවින් යුක්ත බවයි.

විනය ශික්ෂා පැනවීම තුළ බුදුරදුන්ගේ භූමිකාව වෙනස් ආකාරයට හමුවෙයි. විනය පිටකය තුළ දී බුදුරදුන් ආඥාදායකයකු සේ ක්‍රියා කරන ආකාරය පෙනෙයි. විනය පිළිබඳ බුදුරදුන් ක්‍රියා කරන්නේ සූත්‍ර ධර්ම දේශනා කළ ආකාරයට හාත්පසින් වෙනස් වූ අකාරයකිනි. ''දෙසිතො ධම්මො විනයො පඤ්ඤත්තො''[24] විනය පැනවීම් වෙනයම් කෙනකු කිසිවිටකත් භාර කර නැත. විනය පිළිබඳ අග්‍රස්ථානය හිමි වූයේ උපාලි මහරහතන් වහන්සේටය. උන්වහන්සේටවත් විනය ශික්ෂා පැනවීම් සිදු කිරීමට අවස්ථාව දී නැත. බුදුරදුන් විනය දේශනාවෙන් බලාපොරොත්තු වූ පොදු කාරණා දහයක් හමුවෙයි. ''තෙන හි, භික්ඛවෙ, භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච'' වශයෙන් දක්වන්නේ එකී විනය දේශනාවේ අරමුණය.

1. සඞ්ඝසුට්ඨුතාය: 2. සඞ්ඝඵාසුතාය: 3. දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය: 4. පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය: 5. දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය: 6. සම්පරායිකානං ආසවානං පටිඝාතාය: 7. අප්පසන්නානං පසාදාය: 8. පසන්නානං භියොභාවාය: 9. සද්ධම්මට්ඨිතියා: 10. විනයානුග්ගහාය[25]

මෙයින් බුදුරදුන්ගේ බලාපොරොත්තු මනා සේ පැහැදිලි වෙයි. හුදෙක් විනය පැනවූයේ භික්ෂු භික්ෂුණී උභය පාර්ශ්වයේ පහසුව සඳහාය. එනම් නිවන කරා යොමු වීමට අවශ්‍ය මාර්ගෝපදේශන සහ ඊට ඇති දුෂ්කරතා සමනය කිරීම සඳහාය.

විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරො පාමුජ්ජත්ථාය, පාමුජ්ජං පීතත්ථාය, පීති පස්සද්ධත්ථාය, පස්සද්ධි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූතඤාණදස්සනත්ථාය, යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය, නිබ්බිදා විරාගත්ථාය, විරාගො විමුත්තත්ථාය, විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය, විමුත්තිඤාණදස්සනං අනුපාදාපරිනිබ්බානත්ථාය. එතදත්ථා කථා, එතදත්ථා මන්තනා, එතදත්ථා උපනිසා, එතදත්ථං සොතාවධානං යදිදං අනුපාදාචිත්තස්ස විමොක්ඛොති.[26]

පරම විමුත්තිය පත්වීමට විනය දේශනා කරන ලද බව මෙයින් පෙනීයයි.

බුදුරදුන් සූත්‍ර පිටකයේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපයෙන් ක්‍රියා කළත් විනය තුළ දී එසේ සිදු කොට නැත. විනය පිළිබඳ අධිකාරී බලය නිතැතින් ම තමන් අත තබා ගෙන ක්‍රියා කළ බව පෙනෙයි. ඉන් බලාපොරොත්තු වූයේ ශ්‍රාවකයාගේ විමුත්තිය ම වීම විශේෂත්වයකි. තම ශ්‍රාවකයන් කිසිඳු අඩුපාඩු බවකින් තොර සච්චන් බවට පත්කිරීම බුදුරදුන්ගේ ආධ්‍යාශය වූ බව පෙනී යයි. ''අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨපෙතු, සාමණෙරභාවා උද්ධරිත්වා භික්ඛුභාවෙ පතිට්ඨාපෙතූති. අනුකම්පං උපාදායාති අනුද්දයං පටිච්ච; මයි අනුකප්පං, කත්වාති අත්ථො.'' නිතර අකුසලයෙන් මුදවා කුසලයෙහි පිහිටුවීමත් භික්ෂුවක් වශයෙන් පරිපූර්ණත්වයට පත්කිරීමත් මූලික කොටගෙන විනය දේශනා කළ බව පෙනෙයි.

බුද්දානුබුද්දක ශික්ෂා පද පවා අවශ්‍ය නම් වෙනස් කර ගැනීමට අවස්ථාව ලබා දුන්නේ බුදුරදුන්ගේ පරිනිර්වාණයෙන් පසුවය. ''ආඛංකමානො ආනන්ද මමච්චෙන සංඝො ඛුද්දානුඛුද්දක සික්ඛාපදානි සමූහන්තු''[27] ඉන් පැහැදිළි වන්නේ විනය තුළින් ඉස්මතු වන බුද්ධ චරිතය දැඩි ස්ථාවරයක ක්‍රියා කළ බවකි. විනය පිටකය හැඳින්වීම ආණා දේශනා යන්න භාවිත වෙයි. එම භාවිතය අට්ඨකථාවේ දී විස්තර වන්නේ ''පැණවීමට සුදුසු වූ බුදුරදුන් විසින් ආඥාබාහුල්‍යයෙන් දෙසූ හෙයින් ආණා දේශනා නම් වෙයි''[28] විනය ශික්ෂා පද පැනවීම බුදුරදුන් ස්වකීය බලාධිකාරිත්වය මත තබාගෙන ක්‍රියාත්මක වූ බව පෙනෙයි. එයින් කිසිසේත් විනයෙහි ප්‍රජාතන්ත්‍රික



10-CM 33551

ලක්ෂණ නොවේය යන්න ප්‍රකාශ නොවෙයි. විනය පැනවීම බුද්ධ චරිතයේ ස්වභාවය පමණක් මෙහි දී අණාවරණය වෙයි.

බුදුරදුන්ගේ ආඥාබාහුල්‍ය ස්ථාවරයේ බලාපොරොත්තුව වූයේ භික්ෂු භික්ෂුණී දෙපාර්ශ්වයේ සුබ සිද්ධියයි. නිවන කරා යොමු කිරීමයි. විනය තුළින් සිදු වන්නේ හික්මීමයි. හික්මීම නම් ශීලය පරිපූර්ණ වීමයි. එනම් ෂඩින්ද්‍රියන්ගේ සංවරයයි. ඉන්ද්‍රි සංවර ශීලය ඇති වූ විට එය සමාධියට අනුග්‍රහ පිණිස පවතී. සමාධිය ඇති වූ විට එය ප්‍රඥාවට අනුග්‍රහ පිණිස පවතී. ප්‍රඥාව විමුක්තිය පිණිස ම වෙයි. විනය තුළින් ගම්‍ය වන බුද්ධ චරිතය තරමක අධිකාරී බවක් පෙන්නුම් කළත් ඒ ශ්‍රාවකයාගේ හිත සුව පිණිස බව මෙහිලා ප්‍රකාශ කළ යුතුයි.

ආන්තික සටහන්

1. අංගුත්තර නිකාය II කොටස, දොණ සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 1956, 78 පිටුව.
2. එම, යෙසං බො අහං, බ්‍රාහ්මණ, ආසවානං අප්පහීනත්තා දෙවො භවෙය්‍යං, තෙ මෙ ආසවා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා. යෙසං බො අහං, බ්‍රාහ්මණ, ආසවානං අප්පහීනත්තා ගන්ධබ්බො භවෙය්‍යංඤ්ච යක්ඛො භවෙය්‍යංඤ්ච මනුස්සො භවෙය්‍යං, තෙ මෙ ආසවා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා.
3. පපඤ්චසූදනී I කොටස, හේවාවිතාරණ මුද්‍රණ, 1918, 286 පිටුව. අථ මහාසත්තො දෙවතානං පටිඤ්ඤං අදත්වාව කාලදීපදෙසකුලජනෙත්තිආයුපරිච්ඡෙදවසෙන පඤ්චමහාවිලොකනං නාම විලොකෙසි
4. දීඝ නිකාය II කොටස, මහාපදාන සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 16 පිටුව. බොධිසත්තො තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කමි. අයමෙත්ථ ධම්මතා
5. එම, 18 පිටුව. යදා බොධිසත්තො තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමති. අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව

දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා , යත්ථ පිමෙ චන්දිමසූරියා එවං මහිද්ධිකා එවං මහානුභාවා ආභාය නානුභොන්ති, තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති - අඤ්ඤෙපි කිර, භො, සන්ති සත්තා ඉධූපපන්නාති. අයඤ්ච දසසහස්සී ලොකධාතු සඞ්කම්පති සම්පකම්පති සම්පවෙධති. අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. අයමෙත්ථ ධම්මතා.

6. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, චත්තාරො නං දෙවපුත්තා චතුද්දිසං රක්ඛාය උපගච්ඡන්ති මා නං බොධිසත්තං වා බොධිසත්තමාතරං වා මනුස්සො වා අමනුස්සො වා කොචි වා විහෙඨෙසීති. අයමෙත්ථ ධම්මතා.

7. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, පකතියා සීලවතී බොධිසත්තමාතා හොති, විරතා පාණාතිපාතා, විරතා අදින්නාදානා, විරතා කාමෙසුමිච්ඡාචාරා, විරතා මුසාවාදා, විරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා. අයමෙත්ථ ධම්මතා.

8. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, න බොධිසත්තමාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූපසංහිතං, අනතික්කමනීයා ච බොධිසත්තමාතා හොති කෙනචි පුරිසෙන රත්තචිත්තෙන. අයමෙත්ථ ධම්මතා.

9. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, ලාභිනී බොධිසත්තමාතා හොති පඤ්චන්නං කාමගුණානං. සා පඤ්චහි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙති. අයමෙත්ථ ධම්මතා.

10. එම, බොධිසත්තො මාතුකුච්ඡිං ඔක්කන්තො හොති, න බොධිසත්තමාතු කොචිදෙව ආබාධො උප්පජ්ජති, සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා, බොධිසත්තඤ්ච බොධිසත්තමාතා තිරොකුච්ඡිගතං පස්සති සබ්බඞ්ගපච්චඞ්ගිං අහීනින්ද්‍රියං. අයමෙත්ථ ධම්මතා.

11. එම, 20 පිටුව. ධම්මතා එසා, භික්ඛවෙ, සත්තාහජාතෙ බොධිසත්තෙ බොධිසත්තමාතා කාලඞ්කරොති තුසිතං කායං උපපජ්ජති. අයමෙත්ථ ධම්මතා.

12. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යථා අඤ්ඤා ඉත්ථිකා නව වා දස වා මාසෙ ගබ්භං කුච්ඡිනා පරිහරිත්වා විජායන්ති, න හෙවං බොධිසත්තං බොධිසත්තමාතා විජායති. දසෙව මාසානි බොධිසත්තං බොධිසත්තමාතා කුච්ඡිනා පරිහරිත්වා විජායති. අයමෙත්ථ ධම්මතා

13. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යථා අඤ්ඤා ඉත්ථිකා නිසින්නා වා නිපන්නා වා විජායන්ති, න හෙවං බොධිසත්තං බොධිසත්තමාතා විජායති. ඨිතාව බොධිසත්තං බොධිසත්තමාතා විජායති. අයමෙත්ථ ධම්මතා.

14. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, දෙවා පඨමං පටිග්ගණ්හන්ති, පච්ඡා මනුස්සා. අයමෙත්ථ ධම්මතා.

15. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, අප්පත්තොව බොධිසත්තො පථවිං හොති, චත්තාරො නං දෙවපුත්තා පටිග්ගහෙත්වා මාතු පුරතො ඨපෙන්ති අත්තමනා, දෙවි, හොහි; මහෙසක්ඛො තෙ පුත්තො උප්පන්නොති. අයමෙත්ථ ධම්මතා.

16. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, විසදොව නික්ඛමති අමක්ඛිතො උදෙන උදරෙන අමක්ඛිතො සෙම්හෙන අමක්ඛිතො රුහිරෙන අමක්ඛිතො කෙනචි අසුචිනා සුද්ධො විසදො. සෙය්‍යථාපි, භික්ඛවෙ, මණිරතනං කාසිකෙ වත්ථෙ නික්ඛිත්තං නෙව මණිරතනං කාසිකං වත්ථං මක්ඛෙති, නාපි කාසිකං වත්ථං මණිරතනං මක්ඛෙති. තං කිස්ස හෙතු? උභින්නං සුද්ධත්තා. එවමෙව බො, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, විසදොව නික්ඛමති අමක්ඛිතො, උදෙන අමක්ඛිතො සෙම්හෙන අමක්ඛිතො රුහිරෙන අමක්ඛිතො කෙනචි අසුචිනා සුද්ධො විසදො. අයමෙත්ථ ධම්මතා.

17. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, ද්වෙ උදකස්ස ධාරා අන්තලික්ඛා පාතුභවන්ති එකා සීතස්ස එකා උණ්හස්ස යෙන බොධිසත්තස්ස උදකකිච්චං කරොන්ති මාතු ච. අයමෙත්ථ ධම්මතා.

18. එම, 22 පිටුව. ධම්මතා එසා, භික්ඛවෙ, සම්පතිජාතො බොධිසත්තො සමෙහි පාදෙහි පතිට්ඨහිත්වා උත්තරාභිමුඛො සත්තපදවීතිහාරෙන ගච්ඡති සෙතම්හි ඡත්තෙ අනුධාරියමානෙ, සබ්බා ච දිසා අනුවිලොකෙති, ආසභිං වාචං භාසති අග්ගො ාහමස්මි ලොකස්ස, ජෙට්ඨොහමස්මි ලොකස්ස, සෙට්ඨොහමස්මි ලොකස්ස, අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවොති. අයමෙත්ථ ධම්මතා.

19. එම, ධම්මතා එසා, භික්ඛවෙ, යදා බොධිසත්තො මාතුකුච්ඡිම්හා නික්ඛමති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති, අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාරතිමිසා, යත්ථ පිමෙ චන්දිමසූරියා එවංමහිද්ධිකා එවංමහානුභාවා ආභාය නානුභොන්ති, තත්ථපි අප්පමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. යෙපි තත්ථ සත්තා උපපන්නා, තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති අඤ්ඤෙපි කිර, භො, සන්ති සත්තා ඉධූපපන්නානීති. අයඤ්ච දසසහස්සී ලොකධාතු සඞ්කම්පති සම්පකම්පති සම්පවෙධති අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුභවති අතික්කම්මෙව දෙවානං දෙවානුභාවං. අයමෙත්ථ ධම්මතා.

20. මජ්ඣිම නිකාය I කොටස, අරියපරියෙසන සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 406 පිටුව.

21. සුත්තනිපාතය, රාහුල සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006. 100 පිටුව. 338 ගාථාව.

22. මජ්ඣිම නිකාය II කොටස, සේඛ සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 28 පිටුව.

23. එම, 36 පිටුව.

24. මජ්ඣිම නිකාය I කොටස, චූල්ලවෙදල්ල සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 716 පිටුව.

25. දීඝ නිකාය II කොටස, මහාපරිනිබ්බාණ සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 242 පිටුව.

26. පාරාජිකපාළි, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2005, 48 පිටුව. තෙන හි, භික්ඛවෙ, භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස

අත්ථවසෙ පටිච්ච - සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය, පසන්නානං භියෝභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහා. අංගුත්තර නිකාය I කොටස, දුක නිපාතය, විනයපෙය්‍යාලං, 192 පිටුව. පාචිත්තියපාළි I කොටස, 224 පිටුව. පරිවාරපාළි I කොටස, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 4 පිටුව. අංගුත්තර නිකාය VI කොටස, දසක නිපාතය, උපාලි සුත්ත, 124 පිටුව.

27. පරිවාරපාළි II කොටස, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 146 පිටුව.

28. දීඝ නිකාය II කොටස, මහාපරිනිබ්බාණ සුත්ත, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, 2006, 242 පිටුව.

29. සමන්තපාසාදිකා II කොටස, හේවාවිතාරණ මුද්‍රණ, 2014, 12 පිටුව. එත්ථ හි විනයපිටකං ආණාරහෙන භගවතා ආණාබාහුල්ලතො දෙසිතත්තා ආණාදෙසනා.